# කෙසෙල් වර්ග හා එයට වැළඳෙන රෝග

## කෙසෙල්

මියුසා පැරඩිසිකා (Musa Paradisica) යන උද්භිද විද්‍යාත්මක නමින් හැඳින්වෙන කෙසෙල් අකණ්ඨීය පඳුරකි; මෙහි ක්ෂාරධර පටක්යක් ඇත. කඳ දක්නට ලැබෙන්නේ පොළොව අභ්‍යන්තරයේය. භූගත කඳකි. එය රෛසෝමය යයි වායව ඇත්තේ ව්‍යාජ කඳයි. එය නිර්මාණය වී ඇත්තේ පත්‍ර පාද එකතු වීමෙන් කෙසෙල් ඵලය බදරියකි. එය බීජ රහිතය. සංසේචනයෙන් තොරව ඵල හටගනී. එබැවින් මෙය ශාකතෝත්ත ඵලනයයි. පුෂ්ප පිඳෙන් එක් වතාවක් පමණි.

## පස්

හොඳ ජල වහනයක් ඇති තෙතමනය සහිත පස සහ කළු ලෝම පසද, කෙසෙල් වගාවට ඉතා සුදුසුය. සාමාන්‍ය වශයෙන් විෂ ද්‍රව්‍ය වලින් තොර කවර පසක් වුවද කෙසෙල් වලට තෝරාගත හැකිය. බිම් බෑවුම් සහිත නම් පාංශු සංරක්ෂණ ක්‍රමයක් උපයෝගී කොට පස් ආරක්ෂා කල යුතුය. එසේ නැති උවහොත් කෙසෙල් වගාව නිසරුවේ.

## දේශගුණය

කෙසෙල් නිවර්තන කලාපීය භෝගයකි. එබැවින් සිසිල් දේශගුණය එතරම් සුදුසු නොවේ. සිසිල් දේශගුණයකදී පැළෑටි වර්ධනය උවත් වර්ධනය සීඝ්‍ර නොවේ. පත්‍ර සවල්පයක් පමණක් හටගනී. එබැවින් ඵල හටගැනීම ප්‍රමාදවේ.

## කෙසෙල් වර්ග

### 1. බිම් කෙසෙල්

වායව කඳ කුඩාය. පත්‍ර ලා කොළ පාටය. මෙම කෙසෙල් වර්ගය අධික සුළං හමන ප්‍රදේශ වලට යෝග්‍ය වර්ගයකි. ඉදුණු ගෙඩි තරමක් රසවත්ය. එහෙත් කුඩාය. බෝ කිරීම අපහසුය.

### 2. ඇඹුල් කෙසෙල්

මෙම වර්ගය වගා කිරීම පහසුය සීඝ්‍රයෙන් වර්ධනය වේ. ගස් ශක්තිමත්ය. උසය, පත්‍ර විශාලය කොළ පාටය. පොළොවට කඳින් කන්තු මුල් වලින් බැඳී සිටී. ගෙඩි ඉදුණු කල තරමක් ඇඹුල් රසක් ඇත. වද පිදීමේ රෝගයට ඔරොත්තු දේ.

### 3. ඇඹුල් හොඬරවාලු

මෙය තරමක් විශාල වාගයකි. මෙම වර්ගය රත්නපුර සහ ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති දේශගුණයේ හොඳින් වැඩේ. වද පිදීමේ රෝගයට ඔරොත්තුදේ.

### 4. අළු කෙසෙල්

ව්‍යාංජන සඳහා ඉතා යෝග්‍ය වර්ගයකි. ඖෂධීය ගුණයක් ඇත. ඉදුණු ගෙඩිද ආහාර සඳහා යෝග්‍ය වේ.

### 5. පුවාළු

ඉතා රසවත් කෙසෙල් වර්ගයකි. එහෙත් ඇන්ක්රොක් නොහොත් කළුකුඩ නමින් හැඳින්වෙන රෝගයට මෙම කෙසෙල් වර්ගය පහසු වෙන් ගොදුරුවේ.

### කෝලිකුට්ටු

මෙම කෙසෙල් වල ඉදුනු ගෙඩි වල වැඩිපුර ඇත්තේ ග්ලූකෝස් සීනිය. එම නිසා මෙම ගෙඩි ඉතා රසවත්ය. රෝගීන්ට දීමට සුදුසුය.

### ආනමාළු

ගෙඩි දිග, විශාල තැන් බිහිවන, කෙසෙල් වර්ගයකි. ගෙඩි ඉදුනු විටද කොළ පාටය. ලෙල්ල රත්පත් කහපාටකට හැරුණු විම ගෙඩි කඩා හැලීමට පටන් ගනී.

### 8. රත් කෙසෙල්

රතඹලා නමින්ද හැඳින්වෙන මෙම කෙසෙල් වර්ගයට රතුපාට ලෙල්ලක් ඇත. ඉදුණු ගෙඩි එතරම් රසවත් නොවේ. තෙතමනය සහිත පසෙහි මේ කෙසෙල් වර්ගය හොඳින් වගා කල හැකිය, එහෙත් බෝ කර ගැනීම ඉතා අපහසුය.

## රෝග

### 1. කඳකඩා වැටීමේ රෝගය

කෙසෙල් කඳන් කුරුමිණියා නොහොත් වීවිල් (Banana stem weevil) නැමැති කුරුමිණියා කඳ විදීම නිසා මේ රෝගය ඇතිවේ. වීවිල් කඳ කුරුමිණියාගේ ගැහැණු සතා කෙසෙල් ගසේ ව්‍යාජ කඳ විද බිත්තර දමයි. එම බිත්තර වලින් බිහිවන කීටයෝ කඳය සිදුරු කරමින් එහි වසයි, කඳේ අභ්‍යන්තර සිදුරු වීම නිසා එතැනින් දුර්වලවී කඳ කඩා වැටේ.

### 2. කෙසෙල් මුල් කුණුවීමේ රෝගය

කෙසෙල් මුල් විදින වීවිල් (Root weevil) නැමැති කුරුමිණියා කළු පාටය. මෙම කුරුමිණියාගේ ගැහැණු සතා කෙසෙල් කඳේ පාමුල හෝ මැරුණු කෙසෙල් කඳෙක හෝ බිත්තර දමයි. ඉන් බිහිවන කීටයෝ කෙසෙල් භූගත රෛසෝමයේ කුහර ඇති කරමින් යුෂ උරා බොති; පුස් වර්ග හා බැක්ටීරියා වර්ගද, කෙසෙල් පැළෑටියට ඇතුළුවී රෛසෝමය කුණුවීම සිදු කරයි.